# Abstract No 94

## මඤ්ජුශ්‍රීභාෂිත චිත්‍රකර්මශාස්ත්‍රය පෙළොන්නරු යුගයේ බුද්ධප්‍රතිමා නිර්මාණය කිරීමට බලපා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

**පී.පී.එස්. සී.පුෂ්ප කුමාර**
ශාස්ත්‍රවේදී (විශේෂ)තෙවනවසර, සිංහල අධ්‍යයනාංශය, කැලණියවිශ්වවිද්‍යාලය
sahanchathuranga102@gmail.com

මඤ්ජුශ්‍රීභාෂිත චිත්‍රකර්මශාස්ත්‍රය නම් කෘතිය ශ්‍රී ලංකාවේ රචිත අනාදිමත් කාලයක් පුරා අතිශය සම්භාවනාවට පාත්‍ර වූවකි. එය හුදෙක් ඒකල කෘතියක් නොව මඤ්ජුශ්‍රීභාෂිත වාස්තුවිද්‍යාශාස්ත්‍ර නම් කෘතියේ අපරභාගය යි. නාමික ව සලකන කල්හි ඉන් සිත්තම්කරණය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන්නේ යැයි පෙනුණ ද සිත්තම් ශිල්පයේ ඒකාංශයක් වශයෙන් මූර්ති ශිල්පය මෙහි දී විස්තර වෙයි. මෙහි 04 වන පරිච්ඡේදයේ සිට 18 වන පරිච්ඡේදය දක්වා පරිච්ඡේද 15 ක් වෙන් කොට ඇත්තේ ප්‍රතිමාකරණය හා තදාශ්‍රිත කරුණු පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීමට ය. චිත්‍රකර්මශාස්ත්‍රය ක්‍රි.ව.05-07 සියවස්වලට අයත් වේ. මූර්ති කලාවේ විශිෂ්ට නිර්මාණය වන්නේ බුදුපිළිමය යි. ඉන්දියාවේ බුද්ධප්‍රතිමා නිර්මාණය කවදා ඇති වී දැයි නිශ්චිත ව ප්‍රකාශ කළ නොහැක. මථුරා, ගාන්ධාර, අමරාවතී සහ ගුප්ත කලාවන්හි දී පරිපූර්ණත්වයට පත් වූ බුද්ධප්‍රතිමාව, ක්‍රි.ව.03 වන සියවසේ දී බුදුසමය මෙරටට ලැබීමත් සමග ශ්‍රී ලංකාවේ බුද්ධප්‍රතිමා කලාව ආරම්භ වන්නට ඇතැයි විශ්වාස කෙරේ. අනුරාධපුර සහ ඊට පශ්චාත්කාලීන යුගයන්හි මෙරට නිර්මාණය වූ බුද්ධප්‍රතිමා සඳහා මඤ්ජුශ්‍රීභාෂිත චිත්‍රකර්මශාස්ත්‍රයෙහි බලපෑම ලැබී තිබේ. බුද්ධප්‍රතිමා නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු වන ආයාදි ෂඩ් වර්ග, රූපමාන, සෞන්දර්යාත්මක ලක්ෂණ, ලඹ නූල් එලීම, ශුභාශුභ ඵල විභාග, දශ භූමි, ප්‍රතිමාකරණය හා සම්බන්ධ විවිධ ශිල්පීය ක්‍රම , සිංහාසන ප්‍රභේද, රුවන් තැන්පත් කිරීම, වාස්තු දේවතාව, මංගල්‍ය වස්තු භාවිතය සහ විශේෂ අභිචාරවිධි ආදි ප්‍රතිමා මාන විද්‍යාවට ඇතුළත් තොරතුරු රැසක් මඤ්ජුශ්‍රීභාෂිත චිත්‍රකර්මශාස්ත්‍රයෙහි දක්වා තිබේ. ඒ අනුව පොළොන්නරු යුගයෙහි නිර්මාණය කරන ලද බුද්ධප්‍රතිමා සඳහා මඤ්ජුශ්‍රීභාෂිත චිත්‍රකර්මශාස්ත්‍රයෙහි බලපෑම ලැබුණා ද? යන්න සොයා බැලීම පර්යේෂණ ගැටළුව යි. මෙරට ප්‍රතිමාකරණය සම්බන්ධයෙන් විශේෂයෙන් බෞද්ධ ප්‍රතිමාකරණය සම්බන්ධයෙන් පර්යේෂණ බොහෝ ප්‍රමාණයක් සිදු ව පවතී. පුරාවිද්‍යාව, ඉතිහාසය, බෞද්ධ සංස්කෘතිය ආදි විෂයයන් යටතේ මෙම පර්යේෂණයන් බහුල ව සිදු වී ඇති නමුත් එහිදී ඔවුන් විසින් බෙහෙවින් ඉවහල් කරගනු ලැබ ඇත්තේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් ය. අනෙක් අතට ඔවුන්ගේ වැඩි අවධානය යොමු වී ඇත්තේ ප්‍රතිමාවන්හි රූපභේද විද්‍යාවන් පිළිබඳ ව යි. ප්‍රතිමා මාන විද්‍යාව පිළිබඳව හා ප්‍රතිමාකරණ තාක්ෂණය පිළිබඳ ව අවධානය යොමු කිරීම සහ මූලාශ්‍ර අධ්‍යයනයන් සිදු වී ඇත්තේ ඉතා ම අවම මට්ටමකිනි. අන්තර්ජාලය උපයෝගී කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කිරීමට බලාපොරොත්තු වේ. ප්‍රතිමා කලාව සම්බන්ධ තොරතුරු රැසක් අනාවරණය කරන මඤ්ජුශ්‍රීභාෂිත චිත්‍රකර්මශාස්ත්‍රය නම් සංස්කෘත කෘතිය අධ්‍යයනය කරමින් එහි සඳහන් තොරතුරු පොළොන්නරු යුගයේ බුද්ධප්‍රතිමා කලාව පෝෂණය වීමට කෙතරම් දුරට ඉවහල් වී ඇත්දැයි යන්න පරීක්ෂා කිරීම මේ පර්යේෂණයේ මූලික අරමුණ යි.

**ප්‍රමුඛපද :** මඤ්ජුශ්‍රීභාෂිත චිත්‍රකර්මශාස්ත්‍රය, පොළොන්නරුව, බුද්ධ ප්‍රතිමා, මූර්ති කලාව, ප්‍රතිමා මාන විද්‍යාව